# විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

# ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

## පුරප්පාඩු

1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික වෘත්තිකයින්ගෙන් පහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

### කළමනාකරණ සහකාර (MA 1-2) -02 - කොන්ත්‍රාත් පදනම

සුදුසුකම්:

**බාහිර අපේක්ෂකයින් සඳහා :**

a). එක වාරයකදී අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයයන් හයක් සමත් වී තිබීම සහ පහත විෂයයන් ඇතුළුව විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම

සිංහල/දෙමළ
ඉංග්‍රීසි භාෂාව
ගණිතය

b). අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ පොදු පරීක්ෂණය හැර විෂයයන් තුනක් සමත් වී තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා :**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික මට්ටමේ- පුහුණු සහ ප්‍රාථමික මට්ටමේ- නුපුහුණු යන සේවා කාණ්ඩවල සේවකයන් අතරින් පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

අධ්‍යාපන සුදුසුකම්:

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයක් සමත් වී, පහත විෂයයන් ඇතුළුව විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම:

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය

වෙනත්:
ඉහත සඳහන් සේවක කාණ්ඩයට අදාළ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව:** අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:** **MA 1-2-2025 Rs.[46,220 -10x540 -7x630 -12x1,080 -12x1,280 - 84,350]**
**(මූලික වැටුප+ රජය විසින් අනුමත අනෙකුත් දීමනා)**

තනතුරට අදාළ ප්‍රධාන රාජකාරි: වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර පිවිසෙන්න.**http://www.nastec.gov.lk**

**බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය:** පත්කිරීමේ බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් මගින් පවත්වනු ලබන තරඟකාරී ලිඛිත විභාගයක සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

**ඉල්ලුම්පත් සඳහා ක්‍රමවේදය:**

- ජීව දත්ත තොරතුරු ඇතුලත් අයදුම්පත්‍රය සහ සහතික කරන ලද අදාළ සහතික පත්‍රවල පිටපත් සමග ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ සම්බන්ධ කරගත හැකි තොරතුරු සහිතව **අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි., ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව, 06 වන මහළ - D පර්යන්තය, දෙවන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල** යන ලිපිනයට **2026.09.22** දින හෝ ඊට පෙර ලැබෙන සේ **ලියාපදිංචි තැපැලෙන්** එවිය යුතුය. තෝරාගනු ලැබූ අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
  රජයේ සංස්ථා/මණ්ඩල/රාජ්‍ය අංශයේ සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් හරහා යොමු කළ යුතුය.

- මෙම ස්ථිර තනතුරට සේවක අර්ථසාධක අරමුදල (ආයතනික දායකත්වය 12%, සේවක දායකත්වය 8%) සහ සේවක භාර අරමුදල (ආයතනික දායකත්වය 3%) සඳහා හිමිකම් ඇත.

අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි.
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
06 වන මහළ - D පර්යන්තය
දෙවන අදියර, සෙත්සිරිපාය
බත්තරමුල්ල.

**Tel: +94 11 218 6711 Fax: +94 11 218 6713**